# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 24 දරන
# පස සංරක්ෂණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 අගෝස්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

**1996 අංක 24 දරන පස සංරක්ෂණ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 48/92

**පස සංරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 24 දරන පස සංරක්ෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පස සංරක්ෂණ පනතේ දීර්ඝ නාමය වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 450 වන අධිකාරයේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

"පසෙහි නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ද, තත්ත්වය පහත වැටී ඇති ඉඩම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ද, පාංශු ඛාදනය වැළැක්වීම හා අඩු කිරීම සඳහා ද, පස සංරක්ෂණය කිරීම සහ ගංවතුර, ලවනතාව ක්ෂාරත්වය සහ ජලය එකතුවීම සහ නියඟයෙන් සිදුවන අලාභ වලට එරෙහිව ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 1අ, 1ආ, 1ඇ සහ 1ඈ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 1අ, 1ආ, 1ඇ, 1ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"පස සංරක්ෂණ මණ්ඩලය පිහිටුවීම.

1අ. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පස සංරක්ෂණ මණ්ඩලය නම් වූ මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ කෘෂිකර්ම විෂයය භාරව සිටීම සඳහා පත් කරනු ලබන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් මණ්ඩලය සමන්විත විය යුතු ය :—

(අ) අනුපිළිවෙලින් පහත දැක්වෙන විෂයයන් භාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ අමාත්‍යවරයන්ගේ අමාත්‍යාංශවල ලේකම් වරයන්—

(i) පරිසරය ;
(ii) ඉඩම් ;
(iii) මහවැලි සංවර්ධනය ;
(iv) නිවාස හා ඉදිකිරීම් ;

(v) මහා මාර්ග ;
(vi) වැවිලි කර්මාන්ත ;
(vii) කෘෂිකර්මය ;
(viii) මුදල් ;
(ix) පළාත් සභා ;
(x) පතල් හා ඛනිජ ;
(xi) වන සංරක්ෂණය ;
(xii) වාරිමාර්ග ;

(ආ) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඇ) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂවරයා ;

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඊ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පිහිටුවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා ;

(උ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පස සංරක්ෂණය හා ඉඩම් භාවිතයට අදාළ කටයුතුවල නියැලී සිටින රාජ්‍ය නොවන ආයතන දෙකකින් එක් එක් නියෝජිතයා බැගින් නියෝජිතයන් දෙදෙනකු ;

(ඌ) මණ්ඩලය විසින් (අ) ඡේදයේ සඳහන් විෂයයන් හා සම්බන්ධ විශේෂ දැනුමක් ඇති තැනැත්තන් හෝ නිලධරයන් උපරිම වශයෙන් දෙදෙනකු, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලයට අමතරව එකතු කරගත හැකි ය.

(3) පස සංරක්ෂණ මණ්ඩලයේ රැස්වීම්වල දී යම් නිශ්චිත පළාත් සභාවකට අදාළ කාරණා සාකච්ඡාවට ගන්නා විට පළාත් සභාවල කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යාංශවල ලේකම්වරුන්ට එම රැස්වීම්වලට සහභාගි වන ලෙසට ආරාධනය කළ හැකි ය.

(4) (අ) පත් කළ සාමාජිකයකුට, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය ;

(ආ) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම අවස්ථාවක පත් කළ සාමාජිකයකු එම ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය ;

(ඇ) (අ) සහ (ආ) ඡේදවල විධිවිධානවලට යටත්ව, පත් කළ සාමාජිකයකුගේ ධූර කාලය අවුරුදු තුනක් විය යුතු ය ;

(ඈ) පත් කළ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම, ධූරයෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයකින් සිය ධූරය හිස් කරන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට, එම සාමාජිකයා අයත්ව සිටි රාජ්‍ය නොවන ආයතන යෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද මේ ඡේදය යටතේ පත් කළ සාමාජිකයකු ඔහුගේ පූර්ව ගාමියාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධූරය දැරිය යුතු ය ;

(ඉ) රෝගාතුර වීම හෝ අශක්තුතාවට පත් වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධූරයේ කාර්ය ඉටු කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා එකී සාමාජිකයා අයත් රාජ්‍ය නොවන සංවිධානයෙන් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සභාපතිවරයා හා ලේකම්වරයා.

1ආ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ කෘෂිකර්මය විෂයය භාර අමාත්‍ය වරයා ලෙස පත් කරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ සභාපති වරයා ලෙස ක්‍රියා කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම් වරයා ලෙස ක්‍රියා කළ යුතු ය.

මණ්ඩලයේ කර්තව්‍ය.

1ඇ. (1) මණ්ඩලයේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) පහත සඳහන් කටයුතුවලට අදාළව ක්‍රියා මාර්ග යෝජනා කිරීම සහ ඒවාට අදාළ කටයුතු පර්යේෂණ හා වැඩපිළිවෙලවල් සම්බන්ධීකරණය කිරීම,—

(i) පසේ නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම හා පවත්වා ගෙන යාම ;

(ii) යථා පරිදි වූ සංරක්ෂණ ක්‍රියාමාර්ග අඩුකම නිසා තත්ත්වය පහත වැටී ඇති ඉඩම්වල නිෂ්පාදන ධාරිතාව යථා තත්ත්වයට පත් කිරීම.

(iii) තත්ත්වය පහත වැටීමේ ප්‍රවණතාව ඇති ඉඩම් ආරක්ෂා කිරීම ;

(iv) පස සංරක්ෂණය හා එහි නිෂ්පාදන හැකියාව පවත්වා ගැනීමට අවශ්‍ය වන තාක් ප්‍රමාණයට ජලය හා දිය බෙදුම් සංරක්ෂණය කිරීම ;

(ආ) කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන්—

(i) කෘෂිකාර්මික ඉඩම්වල නිෂ්පාදන හැකියාව කෙරෙහි බලපෑමක් ඇති විය හැකි ප්‍රමාණයට එම ඉඩම්වල රොන් මඩ රැඳීම හෝ තත්ත්වය පහත වැටීමට ; සහ

(ii) කෘෂිකාර්මික නිෂ්පාදන හැකියාවට ආධාරක වන දියබෙදුම් සහ වාරි මාර්ග පද්ධතිවල රොන්මඩ රැඳීමට තුඩු දිය හැකි පාංශු ඛාදනය වැළැක්වීම ;

(ඇ) 1 ඈ. වගන්තිය මගින් පිහිටුවනු ලැබූ පස සංරක්ෂණ අරමුදල පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ;

(ඈ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම.

(2) මණ්ඩලයේ කාර්මික කටයුතු පහසු කර ගැනීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද පළාත්, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ඉඩම් භාවිතය සැලසුම් කිරීමේ කමිටුව විමසිය හැකි ය.

පස සංරක්ෂණ අරමුදල.

1 ඈ. (1) "පස සංරක්ෂණ අරමුදල" නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (අ) (i) අරමුදලේ ප්‍රයෝජනය සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ii) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ අරමුදලට ගෙවීමට නියමිත සියලු මුදල් ;

(iii) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන යම් පරිත්‍යාග හෝ ප්‍රදාන ;

(iv) අරමුදලට ගෙවිය යුතු මුදල් බවට මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි සියලු මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සහ මේ පනත මගින් හෝ එය යටතේ එකී අරමුදලින් ගෙවීමට නියම කරනු ලැබිය හැකි සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" ගංවතුර, නියඟය, ලවණීකරණය, නිසරුවීම, රොන්මඩ රැඳීම සහ පස සෝදායාම ඇතුළු විවිධ හේතූන් නිසා ඉඩම් වල තත්වය පහත වැටීමේ ස්වභාවය හා ප්‍රමාණය දැන ගැනීමේ කාර්යය හා මේ පනත යටතේ සංරක්ෂණ ප්‍රදේශ ලෙස තීරණය කළ යුත්තේ කවර ප්‍රදේශ ද යන්න අමාත්‍යවරයා විසින් තීරණය කිරීමේ කාර්යය සඳහා මිනුම් හා විමර්ශන සිදු කිරීමට කටයුතු සැලැස්වීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය. ".

(2) එහි පැති සටහනේ ඇති " පාංශු ඛාදනය " යන වචන වෙනුවට " ඉඩම්වල තත්ත්වය පහත වැටීම " යන වචන ආදේශ කිරීමෙන්.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) " පාංශු ඛාදනය විය හැකි ප්‍රදේශයක් වශයෙන් " යන වචන වෙනුවට " සංරක්ෂණ ප්‍රදේශයක් වශයෙන් " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි පැති සටහනේ ඇති " පාංශු ඛාදන ප්‍රදේශය " යන වචන වෙනුවට " සංරක්ෂණ ප්‍රදේශය " යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ "පාංශු ඛාදන ප්‍රදේශය" හා "පාංශු ඛාදන ප්‍රදේශ" යන වචන යෙදෙන කවර හෝ විටෙක පිළිවෙළින් "සංරක්ෂණ ප්‍රදේශය" හා "සංරක්ෂණ ප්‍රදේශ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) යම් දිය පාරක ඉවුර සෝදායාම සිදුවිය හැකි ලෙස එම දිය පාරෙන් හෝ දිය පාරේ ඉවුරුවලින් යම් ද්‍රව්‍යයක් හාරා ඉවත් කිරීම හෝ එම දිය පාරට හෝ දිය පාරේ ඉවුරට යම් ද්‍රව්‍යයක් දැමීම තහනම් කිරීම හෝ සීමා කිරීම.";

(3) ඒ වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(ඊ) තත්වය පහත වැටී ඇති ඉඩම්වල ඵලදායිතාව වැඩි කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධාන දීමට යම් නියමිත නිලධරයකුට හෝ තැනැත්තකුට බලය පැවරීම ;

(උ) ජලය හෝ දිය බෙදුම් සංරක්ෂණය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් විධාන දීමට යම් නියමිත නිලධරයකුට හෝ තැනැත්තකුට බලය පැවරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "පාංශු ඛාදන ප්‍රදේශ" හා "ඛාදනය" යන වචන වෙනුවට පිළිවෙළින් "සංරක්ෂණ ප්‍රදේශ" සහ "තත්ත්වය පහත වැටීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි පැති සටහනේ ඇති "ඛාදනය" යන වචන වෙනුවට "තත්ත්වය පහත වැටීම" යන වචන ආදේශ කිරීමෙන්,

ප්‍රධාන ප්‍රඥප්තියට 5අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"බලතල පැවරීම.

5අ. මේ පනත මගින් හෝ එය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ වෙන් කර දෙනු ලැබූ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොට්ඨාශයක් භාර ප්‍රාදේශීය ලේකම්වරයා, වෙත පවරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (උඟ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඌළු) තත්ත්වය පහත වැටීමට භාජනය විය හැකි ඉඩම් ආරක්ෂා කිරීම සඳහා සහ එවැනි ඉඩම්වල නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා එම ඉඩම්වල අයිතිකරුවන් විසින් ගත යුතු ක්‍රියා මාර්ග;

(ඌළුළු) පස සංරක්ෂණය සඳහා අදාළ වන තාක් දුරට ජලය හා දිය බෙදුම් සංරක්ෂණය සඳහා ගත යුතු ක්‍රියා මාර්ග.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ ඇති "රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට අඩු නොවන හා රුපියල් පන්දහසකට වැඩි නොවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අර්ථ නිරූපණය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"මණ්ඩලය" යන්නෙන් 1අ වගන්තිය මගින් පිහිටුවන ලද පස සංරක්ෂණ මණ්ඩලය අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"අරමුදල" යන්නෙන් 1ඇ වගන්තිය මගින් පිහිටුවන ලද පස සංරක්ෂණ අරමුදල අදහස් වේ;

"අයිතිකරු" යන්න, යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදුනු විට ඉඩමේ බදු ගැණුම්කරු හෝ උගස් ගැණුම්කරු ඊට ඇතුලත් වේ;

"ජලාශ" යන්නට, ජලාශ, කෘත්‍රිම වැව්, ගංගා, දියපහරවල්, ඇලවල් සහ කඳුරු ඇතුලත් වේ.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.